# සිංහල යක්ෂ ගැටුම

එළාර රජු යක්ෂ ගෝත්‍රිකයකු වී ද යන්න පිළිබඳ ව ප්‍රශ්න මතුකළ හැකි නමුත් ඔහු පරසියාව අසළ පිහිටි ප්‍රදේශයකින් කෙලින් ම මෙරටට පැමිණි බව හෝ පළමුව දඹදිවට පැමිණි අයකුගෙන් පැවත එන්නකු ලෙස මෙරටට පැමිණි බව හෝ විශ්වාස කළ හැකි ය. එසේ පැමිණි එළාර රජුට මෙරට සිටි යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් පිරිසක් සහාය දී ඇති බව පෙනෙයි.

ඇතැමුනට අනුව එළාර රජු නිඝන්ඨ ආගම ඇදහී ය. පන්ඩුකාභය රජු දවස ද මෙරට නිඝණ්ඨයන් සිටි බව කියැවෙයි. මේ නිඝණ්ඨයෝ කවරහු ද යන ප්‍රශ්නය ද මෙහි දී වැදගත් වෙයි. දඹදිව ඇතැම් යක්ෂයන් නිඝන්ඨ ආගම ඇදහූ බවට සාක්ෂි වෙයි. එල්ලෝරා ගුහාවල නෙළා ඇති ප්‍රතිමාවලින් ද ඒ බව හෙළිවෙයි. මෙරට ද ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් නිඝණ්ඨ ආගම අදහන්නට ඇතැයි සිතිය හැකි ය. එළාර රජු ඇතැම් විට මෙරටට පැමිණ අනෙක් ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් අනුගමනය කරමින් නිඝණ්ඨ වන්නට ඇත. එහෙත් මේ සම්බන්ධයෙන් නිගමනයකට පැමිණීමට පෙර තවදුරටත් කරුණු හැදෑරිය යුතු ය.

ඒ කුමක් වුවත් එළාර රජු දෙමළ (සොළී) නොවූ බව පැහැදිලි ය. එකල දඹදිව සොළී හෝ වෙනත් දෙමළ බලයක් ව්‍යාප්ත වී නොතිබීම මෙහි දී බලපාන ප්‍රධාන සාධකය වෙයි. දකුණු දඹදිව යම්කිසි දෙමළ ගෝත්‍රයක හෝ වංශයක හෝ ආධිපත්‍යයක් නොමැති ව ලංකාවේ දෙමළ රජකු ආධිපත්‍යය පිහිටුවීය යන්න පිළිගත හැකි නො වෙයි. දකුණු දඹදිව විවිධ දෙමළ බලාධිපත්‍යයන් තහවුරු වූයේ ක්‍රිස්තු වර්ෂයෙන් දෙවැනි සියවසෙන් පසුව ය. ලංකාවේ දෙමළ ආක්‍රමණ ඉන් පෙර ඇතිවීමට ඉඩක් නැති බව පැහැදිළි ය.

ලංකාවේ සොළී හා වෙනත් දෙමළ ආක්‍රමණ ඇතිවීමට පටන් ගත්තේ කිතු වසරින් පස්වැනි සියවසේ දී පමණ ය. එනම් මහාවංසය ලිවීමට ටික කලකට පෙර ය. එකල සිංහල සංස්කෘතියෙහි දෙමළ යන්න සතුරාට ඇති පර්යාය නාමයක් බවට පත් වී ඇත. මේ සංකල්පය කෙතරම් දුරට මෙරට සංස්කෘතියෙහි පැළපදියම් වී ද යතහොත් ඉන් සියවස් ගණනකට පසුව ලියැවුණු රාජාවලියෙහි පෘතුගීසීන් ගැන කියැවෙන්නේ දෙමළ ලෙස ය. දෙමළ ලෙයින් වැල්ල තෙත් වූ බව කියන්නේ පෘතුගීසි ලේ ගැන සඳහන් කරමිනි.

ලංකාවේ පමණක් නොව කාම්බෝජයේ ද සතුරාට දෙමළ යන්න යොදාගෙන ඇත. අද පවා කාම්බෝජයේ ඇතැම් ප්‍රදේශවල සතුරන් දෙමළ නමින් හඳුන්වනු ලැබෙන බව වාර්තා වෙයි. මේ වැදගත් තොරතුරකි. අග්නිදිග ආසියාවේ ථෙරවාදී රටවල මූලික වශයෙන් ඇත්තේ සිංහල දේශයෙන් ගෙනගිය සංස්කෘතියකි. එක්තරා කාලයක ථෙරවාදී ආගමෙහි හා සංස්කෘතියෙහි ලෝක මධ්‍යස්ථානය වී ඇත්තේ ලංකාව ය. ඒ රටවල් අනුගමනය කෙළේ ලංකාව මිස දඹදිව නො වෙයි.

මේ හේතුවෙන් සිංහල බෞද්ධ සංස්කෘතියේ ඇතැම් අංග ඒ රටවල පැතිරී ගියේ ය. ඒ සමග සිංහලයන් ළග තිබූ ඇතැම් සංකල්ප හා දැනුම ද ඒ රටවල පැතිර ගොස් ඇත. සතුරා දෙමළ යනුවෙන් හඳුන්වා දීම එක් අංගයක් වූ සංස්කෘතියක් කාම්බෝජයේ ඇති වී තිබෙන්නේ මේ සංස්කෘතික පැතිරීම හේතුවෙනි. ඒ සංස්කෘතික ආධිපත්‍යයක් ද නො වෙයි. සංස්කෘතික ආධිපත්‍යයකින් තොරව යම් සංස්කෘතියක් ඇතැම් රටවල පැතිරෙන්නේ කෙසේ ද යන්න තවදුරටත් අධ්‍යයනය කළයුතු කරුණක් වෙයි. එහි දී මහාසම්ප්‍රදාය යන විලම්බීත සංකල්පය නොවැදගත් වෙයි.

සිංහල සංස්කෘතියෙහි පස්වැනි සියවසෙහි පමණ ඇති වූ මේ අංගය, එනම් සතුරා දෙමළ නමින් හැඳින්වීම අනාගතයට පමණක් නොව අතීතයට ද බල පා ඇති බව පැහැදිළි ය. එළාර රජු දෙමළ වී ඇත්තේ ඒ අනුව ය. අප කලින් ද සඳහන් කර ඇති ආකාරයට එළාර රජු දෙමළ ලෙස හඳුන්වනු ලැබුයේ මහාවංස කර්තෘ මහානාම හිමියන් විසින් නො වෙයි. අතීතයේ ද සිටි සතුරු ආක්‍රමණිකයන් දෙමළ ලෙස හැඳින්වීමට ඒ වන විට සිංහලයන් පුරුදු වී තිබූ බව පෙනී යයි. මහානාම හිමියන් කර ඇත්තේ ඒ සම්ප්‍රදාය දිගට ම ගෙන යෑම පමණකි.

© Prof. Nalin De Silva

එළාර රජු දෙමළ ලෙස හැඳින්වීම එකල ප්‍රශ්නයක් නොවුණ ද  අද ප්‍රශ්නයක් බවට පත් වී ඇත. මෙරට දෙමළ ඉතිහාසයක් එළාට රජුගේ හෝ එයටත් පෙර හෝ කාලයේ සිට ඇති බව පෙන්වීමට අවශ්‍ය පුද්ගලයෝ මහාවංසයෙහි සඳහන් මේ පුවත මහත් අභිරුචියෙන් යොදාගනිති. එහෙත් ඒ පුවත වෙනත් කිසිම පුවතකින් හෝ සෙල්ලිපියකින් හෝ තහවුරු නො වෙයි. වෙනත් කිසිදු සාධකයක් සමග සංගත නොවන මේ තොරතුර තේරුම්ගත හැකි හොඳම ආකාරය ඉහතින් සඳහන් කෙරී ඇත. කිසිවක් තේරුම්ගත නොහැකි ඇතැම් දේශපාලනඥයන්ට එළාර රජුගේ පරසියන් සම්භවය නොවැටහෙන නමුත් එය අනෙක් සාධක සමග සංගත වෙයි.

සිංහල ජාතිය ගොඩනැගීමෙහි දී ප්‍රධාන බාධාව එල්ල වී ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් බව පැහැදිළි ය. අර්ධ වෛදිකයන් පැමිණ තැන තැන කුඩා රාජධානි පිහිටුවා ගෙන ඇති මුත් දිගින් දිගට ම යක්ෂ ගෝත්‍රිකයන්  ඔවුන්ට එරෙහිව සටන් කර ඇති බව පෙනී යයි. එක්තරා අවස්ථාවක දී සිංහ වාංශික කුමරුවකු යක්ෂ ගෝත්‍රික කුමරියක වූ කුවේණි හෙවත් කුවණ්නා හෙවත් කළු වර්ණ ඇත්තී සමග එකතු වී යක්ෂ ගෝත්‍රික නායකයන් බොහෝ ගණනක් මරා දමා තරමක බලවත් රාජ්‍යයක් පිහිටුවා ගෙන ඇත. මේ කුමරා විජය නමින් හැඳින්වෙනුයේ ජයගත් තැනැත්තා යන අරුතින් යැයි විශ්වාස කළ හැකි ය.

එහෙත් යක්ෂ ගෝත්‍රිකයන් පොදුවේ අර්ධ වෛදිකයන්ට එරෙහිව කළ සටන අත්හිටුවා නැති බව පැහැදිළි ය. ඇතැම් විට සියවස් පහක හයක පමණ කාලයක් තිස්සේ කෙරී ගෙන ගිය මේ සටන් යම් ආකාරයකට හෝ සංසිඳී ඇත්තේ පණ්ඩුකාභය කුමරුගේ කාලයෙහි ය. එතුමාගේ කාලය වන විට එකතු වී ජාතියක් ගොඩනැගීමට සූදානම් වූ යක්ෂ ගෝත්‍රික නායකයන් මෙන් ම සිංහ හා වෙනත් වාංශික අර්ධ වෛදිකයන් ද සිටි බව පෙනී යයි. චිත්තරාජ හා කාළදේව එවැනි යක්ෂ ගෝත්‍රික නායකයන් වූ අතර අභය කුමරු හා පඬුවස්දෙව් රජු සමගියට කැමති වූ සිංහ වාංශිකයෝ වූහ. ඒ අතර දිඝගාමිණී වැනි ශාක්‍ය කුමරුවෝ ද සිටියහ. මේ සියළු දෙනාගේ ආධාරයෙන් පඬුඅබා කුමරු ජාතිය ගොඩනැගීමට විරුද්ධ වුවන් පරදවා සිංහල ජාතිය ගොඩනැගීම අරඹා ඇත.

මේ වන විට මෙරට සිටි නාග දේව ආදී අනෙක් ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයන් සමග එකතු වී සිටි බව පැහැදිළි ය. ඒ ගෝත්‍රිකයන් අර්ධ වෛදිකයන් සමඟ හෝ යක්ෂ ගෝත්‍රිකයන් සමග හෝ කළ සටන් පිළිබඳ ව වංසකතාවලින් එතරම් තොරතුරක් ලබාගත නො හැකි ය. කෙසේ හෝ වේවා පඬුඅබා රජු සිංහල ජාතිය ගොඩනැගීමේ කටයුත්ත ආරම්භ කළ තැනැත්තා ලෙස හැඳින්වීම නිවැරදි ය.

එහෙත් මෙයින් කියැවෙන්නේ යක්ෂ ගෝත්‍රික සියල්ලන් සිංහල ජාතියට ඇතුල් වූ බව නො වෙයි. එමෙන් ම සිංහල ජාතියට ඇතුල් නොවූ ඇතැම් අර්ධ වෛදිකයන් රුහුණේ විසූ බව පෙනී යයි. පඬුඅබා කුමරු අතින් ඇතැම් අර්ධ වෛදිකයන් ඝාතනය වන්නට ඇති නමුත් මේ සටන් රුහුණට එතරම් බලපා ඇති බවක් නො පෙනෙයි. එසේ ම පඬුඅබා කුමරු අතින් අනුරාධපුරය අවට වුව ද අර්ධ වෛදිකයන් සමග ඇති කරගත් සමගියට විරුද්ධ වූ යක්ෂයන් ඝාතනය වූ බවක් නො පෙනෙයි.

ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් දිගටම සිංහලයන්ට හා සිංහ වංශයට විරුද්ධව කටයුතු කර ඇති බව මහාවංසයෙන් හෙළි වෙයි. දේවානම්පිය තිස්ස රජු දඩයමේ යන විට මිහිඳු මහා රහතන් වහන්සේ රජුට තිස්ස යැයි නමින් කතාකළ අවස්ථාවේ දී රජු බිය වී ඇත්තේ එසේ කතාකෙළේ යක්ෂයකු දැයි විමසිලිමත් වෙමිනි. මෙයින් කියැවෙන්නේ එකල රජුට අවනත නො වූ යක්ෂ ගෝත්‍රිකයන් මිහින්තලේ අවට සිටි බවත් ඔවුන් රජුට නම කියා කතා කළ බවත් ය. රජු යක්ෂ ගෝත්‍රිකයන් ගැන යම් බියකින් පසු වූ බව ද ඒ කතාවෙන් පැහැදිළි වෙයි.

සිංහලයන් දේවානම්පිය තිස්ස රජු කාලයෙහි නිල වශයෙන් බෞද්ධයන් වීමෙන් පසුව යක්ෂ ගෝත්‍රිකයන් එයට ද අඩුම තරමින් එතරම් කැමැත්තක් දක්වා නැති බව ද පෙනී යයි. අප බොහෝ අවස්ථාවල සඳහන්කර ඇති පරිදි අර්ධ වෛදිකයන්ගේ හා අනෙක් ගෝත්‍රවල චින්තනය එතරම් වෙනස් නොවූ අතර බුද්ධදහම ද ඒ චින්තනයෙන් ම පැන නැගි එකක් විය. එබැවින් සිංහලයන් බවට පත් ව සිටි අර්ධ වෛදිකයන්ට හා නාග දේව ආදී අනෙක් ගෝත්‍රවල ජනයාට බෞද්ධ වීම කිසිසේත් ම ගැටළුවක් නො වී ය. එහෙත් යක්ෂ ගෝත්‍රියන්ට බෞද්ධයන් වීම තරමක ගැටළුවක් වන්නට ඇත්තේ ඔවුන් පර්සියාවේ සිට රැගෙන ආ චින්තනය බුද්ධදහමට පදනම් වූ චින්තනයෙන් වෙනස් වූ නිසා යැයි සිතිය

© Prof. Nalin De Silva

හැකි ය. ලංකාවේ පමණක් නොව දඹදිව ද ඒ එසේ ම සිදු වී ඇත. මෙයින් කියැවෙන්නේ කිසිම යක්ෂ ගෝත්‍රිකයකු බෞද්ධ නොවූ බව නො වේ. ඇතැම් බමුණන් මෙන් ම ඇතැම් යක්ෂයන් ද බෞද්ධ වී ඇත.

වංසකතාවල අනෙක් ගෝත්‍රිකයන් ගැන නොමැති ආකාරයකින් යක්ෂ ගෝත්‍රිකයන් ගැන සඳහන්වන්නේ යක්ෂ ගෝත්‍රිකයන් හා සිංහලයන් අතර වූ මේ වෙනස හේතුකොටගෙන බව විශ්වාස කළ හැකි ය. බුදුන්වහන්සේ මහියංගනයට වැඩම කර යක්ෂයන් දමනය කළ බවටත් ඔවුන් ගිරි දිවයිනට පිටත්කර හැරි බවටත් වංසකතාවෙහි සඳහන්වන්නේ බුදුන්වහන්සේ යක්ෂයන් එසේ පිටත්කර හැරි නිසා නොවන බව පැහැදිළි ය. මහාකාරුණිකයන් වහන්සේ කිසිම සත්ව වර්ගයකට එසේ නොකරන බව සිතාගැනීම අපහසු නො වෙයි.

යක්ෂ ගෝත්‍රිකයන් දිගින් දිගට ම සිංහල බෞද්ධයනට විරුද්ධවීම නිසා දේවානම්පිය තිස්ස රජුගේ කාලය හා වංසකතා ලියැවුණු කාලය අතර බුදුන්වහන්සේ හා යක්ෂ ගෝත්‍රිකයන් අතර එවැනි සිද්ධියක් සිදු වූ බවට සිංහලයන් අතර කතාවක් ගෙතෙන්නට ඇතැයි සිතිය හැකි ය. ගැමුණු රජු දවස වන විට ද යක්ෂ බලය සම්පූර්ණයෙන් ම නැතිව ගොස් නො තිබුණි. එළාර රජු ඇතැම්විට යක්ෂ ගෝත්‍රිකයකු නොවුව ද යම් යක්ෂ සම්බන්ධයක් තිබෙන්නට ඇති බව පැහැදිළි ය. ඒ යක්ෂ සම්බන්ධකම් ඔස්සේ ඔහුට අනුරාධපුරයේ රජවීමට හැකිවූවා පමණක් නොව අවුරුදු හතළිස් හතරක් රජකම පවත්වාගෙන යෑමට ද හැකි විය. එහි දී මහවැලි ගඟ අසබඩ පදිංචි වී සිටි යක්ෂ ගෝත්‍රිකයන්ගේ ආරක්ෂාව ද ඔහුට ලැබී ඇත. රුහුණෙන් අනුරාධපුරයට එන රජකු මහවැලි ගඟ තරණය කළ යුතු විය. මහවැලි ගඟ දිගේ යක්ෂ ගෝත්‍රික බලය තහවුරු කිරීමෙන් එසේ රුහුණේ රජකු අනුරාධපුරයට යෑම වළකා එළාර රජුට ආරක්ෂාවක් ලබාදීමට යක්ෂයන්ට හැකිවිය. ගැමුණු කුමරු අනුරාධපුරයට යන අතර මහවැලි ගඟ දිගේ බිඳ දැමූ දෙතිස් බලකොටු දෙමළ බලකොටු නොව යක්ෂ බලකොටු වූ බව කිව හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva